සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

60 S I

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

නම : ........................................ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I කාලය : පැය 01යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40ක් හිමිවේ.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ X ලකුණ යොදන්න.

- **පහත සිද්ධිය ඇසුරින් අංක 01 සිට 04 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සීමාසහිත මොබිටෙල් ශ්‍රී ලංකා සමාගම තම සේවා දායකයන්ට අන්තර්ජාලයට සම්බන්ධ වී බිල්පත් ගෙවීමට සහ වෙනත් සේවා අවශ්‍යතා සලසා ගැනීමට අවස්ථාව ලබා දී ඇති අතර සම්පත් බැංකුව විසින් බැංකුව වෙත නොගොස් බැංකුවේ වෙබ් අඩවියට සම්බන්ධ වී බැංකු ගණුදෙනු කිරීමට තම ගණුදෙනුකරුවන්ට අවස්ථාව ලබා දී ඇත.

(01) සීමාසහිත මොබිටෙල් ශ්‍රී ලංකා සමාගම සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතා කුමක් ද?
(1) ආහාර (2) ප්‍රවාහනය (3) සන්නිවේදනය (4) විනෝදය

(02) සීමාසහිත මොබිටෙල් ශ්‍රී ලංකා සමාගම අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ලක්‍ෂණයකි.
(1) වගකීම අසීමිත වීම. (2) නෛතික පුද්ගලභාවය තිබීම.
(3) අඛණ්ඩ පැවැත්මක් නො තිබීම. (4) පොදු අංශයේ ව්‍යාපාරයක් වීම.

(03) සම්පත් බැංකුව සලසන ඉහත සිද්ධියේ සඳහන් බැංකු සේවාව වන්නේ,
(1) ටෙලි බැංකු සේවාව ය. (2) අන්තර් බැංකු කටයුතු ය.
(3) සමාජ ජාලා බැංකු කටයුතු ය. (4) ජංගම බැංකු කටයුතු ය.

(04) සම්පත් බැංකුව වැනි වානිජ බැංකුවලට පමණක් පවත්වාගෙන යා හැකි ගිණුම් වර්ගයකි.
(1) ඉතිරි කිරීමේ ගිණුම් (2) ස්ථාවර තැන්පතු ගිණුම්
(3) ජංගම ගිණුම් (4) වනිතා වාසනා ගිණුම්

"විස්ඩම් ටෙල්" දුරකථන සමාගම විසින් නව අන්තර්ජාල සේවාවක් පාසල් සිසුන් සඳහා ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරය ද සහිතව අධ්‍යාපන කටයුතු සඳහා පමණක් භාවිත කළ හැකි ආකාරයට සැකසීමට තීරණය විය.

- **ඉහත සිද්ධිය ඇසුරින් අංක 05 සිට 06 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(05) "විස්ඩම් ටෙල්" සමාගම සම්බන්ධ නිවැරැදි ප්‍රකාශය තෝරන්න.
(1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. (2) සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි.
(3) සමාජ සේවා සපයන ආයතනයකි. (4) අයිතිය රජය සතු ආයතනයකි.

(06) මෙම සිද්ධියට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරය ලැබීම දුරකථන සමාගමට,
(1) ශක්තියකි. (2) දුර්වලතාවයකි.
(3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

NWP EXAM

(07) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර මතභේද වළක්වා ගැනීම සඳහා ගත හැකි වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය තෝරන්න.

(1) හවුල සඳහා ළඟ ම මිතුරන් බඳවා ගැනීම.
(2) සුදුසු නායකයකු පත්කර ගැනීම.
(3) හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කිරීම.
(4) හවුල්කරුවන් අතර එකඟතාවයක් ඇති කර ගැනීම.

(08) සමාගමක් එහි කොටස්කරුවන්ගෙන් වෙන් වූ වෙනම ඒකකයක් බවට පත් කිරීමට නම්,

(1) අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය සිදු කළ යුතු ය.
(2) සමාගම් නාමය ලියාපදිංචි කළ යුතු ය.
(3) කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කළ යුතු ය.
(4) සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ යුතු ය.

(09) චෙක්පතක් වඩාත් ආරක්ෂාකාරීව ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,

(1) හැකි තරම් ඉදිරි දිනයන් යොදා ලිවීම.
(2) ආදායකයාගේ නම ඉංග්‍රීසියෙන් පමණක් ලිවීම.
(3) චෙක්පතෙහි සංශෝධන ඇත්නම් ඒවා පැහැදිලිව නිවැරැදි කිරීම.
(4) සුදුසු පරිදි රේඛනය කිරීම.

(10) කොළඹ පිහිටා ඇති ප්‍රධාන කාර්යාලයට කුරුණෑගල ශාඛාව විසින් දෛනික වාර්තා යැවීම සඳහා තෝරාගත යුතු වඩාත් සුදුසු සන්නිවේදන මාධ්‍යය තෝරන්න.

(1) දුරකථනය (2) වයිබර් (Viber) තාක්ෂණය
(3) ලිපි (4) විද්‍යුත් තැපැල

(11) සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු සාධකයක් සඳහා නිදසුනක් වන ප්‍රකාශය වන්නේ,

(1) කොළඹ සිට කන්කසන්තුරෙයි දක්වා නගරාන්තර දුම්රිය සේවාවක් ඇරඹීම.
(2) 2020 වසරේ දී මධ්‍යම අධිවේගී මාර්ගය ජනසතු කිරීම.
(3) ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහා දුම්රිය සේවාව යොදා ගැනීම.
(4) මගී බස්රථ තුළ ඇසෙන ගීත වෙනුවට සුභාෂිත ගීත තැටියක් හඳුන්වා දේ.

(12) භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන විශාල නෞකාවකට අදාළ ප්‍රවාහන මූලිකාංග සඳහා නිදසුන් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) ජලමාර්ග, ඩීසල්, තොටුපල (2) ඩීසල්, වරාය, ගුවන්මාර්ග
(3) වරාය, ජලමාර්ග, ඩීසල් (4) වරාය, ගුවන්මාර්ග, සුළං

(13) රටකට විදේශ වෙළෙඳාම අවශ්‍ය වීමට බලපාන ප්‍රධාන හේතුවක් නොවන්නේ,

(1) රටක අතිරික්ත නිෂ්පාදන විදේශ රටවලට විකිණීම අවශ්‍ය වීම.
(2) දේශීය ව්‍යාපාර සඳහා විදේශ වෙළෙඳපොළක් සොයා ගැනීම.
(3) විදේශීය සන්නම් සඳහා "රටතුළ ඉහළ ජනප්‍රියතාවයක් පැවතීම."
(4) භාණ්ඩ හා සේවා සියල්ලෙන් ම රට ස්වයංපෝෂිත වීම.

(14) ශ්‍රී ලංකාව විසින් අපනයනය කරනු ලබන භාණ්ඩ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) තේ, රෙදි, දැව, ඛනිජ තෙල් (2) රබර්, කැපූ පොල්, යන්ත්‍ර, කිරිපිටි
(3) නිමි ඇඳුම්, තේ, රබර්, කුළුබඩු (4) සුළු අපනයන බෝග, මැණික්, රෙදි, මෝටර් රථ

(15) ව්‍යාපාර ආයතනයන් තම ආයතනයට අවශ්‍ය සේවකයින් සංඛ්‍යාව තීරණය කිරීම ............................................ වන අතර විවිධ අංශ සඳහා වැඩ මූලිකවරුන් පත් කිරීම .......................................... නම් වේ. හිස්තැන් සඳහා නිවැරැදි පිළිතුර වනුයේ,

(1) සැලසුම්කරණය, සංවිධානකරණය (2) සැලසුම්කරණය, මෙහෙයවීම
(3) සංවිධානකරණය, මෙහෙයවීම. (4) සංවිධානකරණය, පාලනය

NWP EXAM

(16) "ඉලක්ක වෙළෙඳපොළ" යන්න පැහැදිලි කරීම සඳහා වඩාත් සුදුසු නිදර්ශනය පහතින් තෝරන්න.

(1) සුපිරි වෙළෙඳසැල් තුළ ක්ෂණික ආහාර අලෙවිය
(2) ගෙන් ගෙට ගොස් දුරකථන සම්බන්ධතා අලෙවිය
(3) දියවැඩියා රෝගීන් සඳහා විශේෂිත පාවහන් අලෙවිය
(4) උත්සව සමය සඳහා ඇඳුම් පැළඳුම් මත වට්ටම් ලබාදීම.

(17) පහත දක්වා ඇති ගිණුම් අතරින් වත්කම් ගිණුම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A. ණයහිමි ගිණුම
B. මුදල් ගිණුම
C. කාර්යාල උපකරණ ගිණුම
D. ප්‍රාග්ධන ගිණුම
E. ණයගැති ගිණුම

(1) A, B හා C
(2) A, B හා D
(3) B, C හා D
(4) B, C හා E

(18) ව්‍යාපාරයේ වගකීමක් වැඩිවීමට හේතුවන ගණුදෙනුව තෝරන්න.

(1) රු. 8 000 ක භාණ්ඩ තොගයක් රු. 10 000 ක ණයට විකිණීම.
(2) රු. 12 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
(3) රු. 4 000 ක විදුලි බිල ගෙවීම.
(4) රු. 3 000 ක් ණයහිමියන්ට ගෙවීම.

(19) ලක්ෂාන්ගේ වයාපාරයේ 2020/01/01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| 120 000 | = | 90 000 | + | 30 000 |

2020/01/02 දින රු. 12 000 ක බැංකු ණය වාරිකය ගෙවූ අතර එහි ඇතුළත් බැංකු ණය පොළිය රු. 2 000 කි. මෙම ගණුදෙනුවෙන් පසු නිවැරැදි සමීකරණය දැක්වෙන පිළිතුර තෝරන්න.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 108 000 | = | 78 000 | + | 30 000 |
| (2) | 108 000 | = | 90 000 | + | 18 000 |
| (3) | 108 000 | = | 80 000 | + | 28 000 |
| (4) | 108 000 | = | 88 000 | + | 20 000 |

(20) රු. 10 000 ක ණයහිමියෙකුට ණය ආපසු ගෙවීමේ දී රු. 1 000 ක වට්ටමක් හිමිවිය. එම ගනුදෙනුවේ ද්විත්ව සටහන දැක්වෙන්නේ,

| | | | |
|---|---|---|---|
| (1) | ණයහිමි ගිණුම | හර | රු. 10 000 |
| | මුදල් ගිණුම | බැර | රු. 10 000 |
| (2) | ණයහිමි ගිණුම | හර | රු. 10 000 |
| | දුන්වට්ටම් ගිණුම | බැර | රු. 1 000 |
| | මුදල් ගිණුම | බැර | රු. 9 000 |
| (3) | ණයහිමි ගිණුම | හර | රු. 10 000 |
| | ලද වට්ටම් ගිණුම | බැර | රු. 1 000 |
| | මුදල් ගිණුම | බැර | රු. 9 000 |
| (4) | ණයහිමි ගිණුම | හර | රු. 9 000 |
| | මුදල් ගිණුම | බැර | රු. 9 000 |

NWP EXAM

(21) ව්‍යාපාර ආයතනයක සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A. රු. 5 000 ක මුදලක් අයිතිකරු ගැනිලි කිරීම.
B. රු. 500 000 ක මෝටර් රථයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ණයට මිලදී ගැනීම.
C. රු. 2 000 ක ගමන් වියදමක් ගෙවීම.
D. රු. 500 ක භාණ්ඩ තොගය අයිතිකරු ගැනිලි කිරීම.

ඉහත ගණුදෙනු අතරින් පොදු ජ්'නලයේ සටහන් කරන ගනුදෙනු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A, B (2) A, C
(3) B, C (4) B, D

- **ප්‍රශ්න අංක 22 හා 23 ට පිළිතුර සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සිල්ලර වෙළෙඳ ව්‍යාපාර ආයතනයක සිදු වූ ගණුදෙනු කීපයක් හා ඊට අදාළ මූලාශ්‍ර ලේඛන කීපයක් පහත දැක්වේ.

| | ගණුදෙනුව | | මූලාශ්‍ර ලේඛනය |
|---|---|---|---|
| 1. | රු. 5 000 ක වැටුප් ගෙවීම. | A. | ජ්'නල් වවුචරය |
| 2. | රු. 4 000 ක භාණ්ඩ ණයට ගැනීම. | B. | ලදුපත |
| 3. | රු. 60 000 ක කාර්යාල උපකරණ ණයට ගැනීම. | C. | ගෙවීම් වවුචරය |
| 4. | රු. 2 000 ක කොමිස් ආදායමක් ලැබීම. | D. | ගැනුම් ඉන්වොයිසිය |

(22) ඉහත ගනුදෙනු අනුපිළිවෙළට මූලාශ්‍ර ලේඛන ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) C, D, B, A (2) C, D, A, B
(3) C, A, D, B (4) B, D, A, C

(23) ඉහත ගනුදෙනු සටහන් කිරීම සඳහා අදාළ වන මූලික සටහන් පොත් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) මුදල් පොත, ගැනුම් ජ්'නලය, ගැනුම් ජ්'නලය, මුදල් පොත
(2) මුදල් පොත, ගැනුම් ජ්'නලය, පොදු ජ්'නලය, පොදු ජ්'නලය
(3) මුදල් පොත, පොදු ජ්'නලය, ගැනම් ජ්'නලය, මුදල් පොත
(4) මුදල් පොත, ගැනුම් ජ්'නලය, පොදු ජ්'නලය, මුදල් පොත

(24) ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 7 500 කි. 2020/01/01 සිට අග්‍රිමය තවත් රු. 1 000 කින් වැඩි කිරීමට තීරණය කළ අතර 2019 දෙසැම්බර් මාසයේ සුළු වියදම් වල එකතුව රු. 7 100 ක් වූයේ නම් 2020/01/01 දින ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කීය ද?

(1) රු. 7 100 කි. (2) රු. 7 500 කි.
(3) රු. 8 100 කි. (4) රු. 8 500 කි.

(25) 2020/01/31 දිනට ව්‍යාපාරයක බැංකු ගිණුමේ රු. 3 500 ක බැර ශේෂයක් දැකිය හැකි විය. එය අදාළ ව්‍යාපාරයට,

(1) වත්කමකි. (2) වගකීමකි.
(3) ආදායමකි. (4) වියදමකි.

(26) ණයගැති රුවන්ගෙන් ලද රු. 25 000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීමෙන් පසුව අගරු වී ඇති බව බැංකුව විසින් දැනුම් දී ඇත. මෙය නිවැරැදිව ගිණුම්ගත කර ඇත්තේ,

(1)
| | | | |
|---|---|---|---|
| ණයගැති ගිණුම | හර | 25 000 | |
| ණයහිමි ගිණුම | බැර | | 25 000 |

(2)
| | | | |
|---|---|---|---|
| ණයගැති ගිණුම | හර | 25 000 | |
| බැංකු ගිණුම | බැර | | 25 000 |

(3)
| | | | |
|---|---|---|---|
| බැංකු ගිණුම | හර | 25 000 | |
| ණයගැති ගිණුම | බැර | | 25 000 |

(4)
| | | | |
|---|---|---|---|
| බැංකු ගිණුම | හර | 25 000 | |
| ණයහිමි ගිණුම | බැර | | 25 000 |

NWP EXAM

- **27, 28 හා 29 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත තොරතුරු භාවිත කරන්න.**

අවිශ්කගේ ව්‍යාපරයේ 2020/01/31 දිනට බැංකු ගිණුමේ පැවැති ශේෂය රු. 32 000 කි. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය මීට සමාන නොවීය. පහත හේතු වෙනසට බලපා ඇත.

A. තැන්පත් කළ නිශ්කාශනය නොවූ චෙක්පත් රු. 4 000 කි.
B. ස්ථාවර නියෝග මත ගෙවූ රක්‍ෂණ වාරිකය රු. 6 000 කි.
C. ණයගැතියකු විසින් සෘජුවම ගිණුමට ප්‍රේෂණය කළ මුදල රු. 2 000 කි.
D. නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 3 000 කි.

(27) බැංකු ගිණුම සංශෝධනයේ දී සැලකිල්ලට ගනු ලබන්නේ,
(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

(28) සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය කොපමණ ද?
(1) රු. 36 000 කි. (2) රු. 34 000 කි. (3) රු. 29 000 කි. (4) රු. 28 000 කි.

(29) බැංකු ප්‍රකාශනයේ පැවැති ශේෂය කොපමණ ද?
(1) රු. 27 000 කි. (2) රු. 28 000 කි. (3) රු. 37 000 කි. (4) රු. 38 000 කි.

(30) කසුන්ගේ ව්‍යාපාරයේ 2018/01/01 දිනට හිමිකම රු. 600 000 ක් වූ අතර 2018/12/31 දිනට හිමිකම රු. 680 000 කි. වර්ෂය තුළ අයිතිකරුගේ ගැනිලි රු. 20,000 ක් නම් එම වර්ෂය තුළ උපයා ඇති ශුද්ධ ලාභය
(1) රු. 20 000 කි. (2) රු. 10 000 කි. (3) රු. 80 000 කි. (4) රු. 680 000 කි.

(31) බැංකු ප්‍රකාශනයේ දක්නට ඇති වටිනාකමක් වනුයේ,
(1) ව්‍යාපාරය ගෙවූ රු. 1 000 ජල බිල්පත
(2) ස්ථාවර නියෝග මත ගෙවූ රු. 3 000 රක්‍ෂණ වාරිකය
(3) ව්‍යාපාරය පොලී ආදායම ලෙස ලැබුණු රු. 4 000
(4) බැංකුවේ තැන්පත් කළ උපලබ්ධි නොවූ රු. 2 000 ක චෙක්පත

(32) බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩිවීමට බලපාන හේතුවක් වනුයේ,
(1) ණයගැති සෘජු ප්‍රේෂණ තිබීම. (2) බැංකුව රැස්කළ ලාභාංශ ආදායම්
(3) බැංකුව අයකළ බැංකු ගාස්තුවක් තිබීම. (4) තැන්පත් කළ චෙක්පතක් නිශ්කාෂණය වී තිබීම.

(33) බැංකු අයිරාව ලෙස හැඳින්වෙන්නේ,
(1) බැංකු ගිණුමේ ඇති හර ශේෂයයි.
(2) බැංකු ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීමට දුන් කෙටිකාලීන ණයකි.
(3) ව්‍යාපාරය බැංකුවකින් මුදලින් ලබාගත් කෙටිකාලීන ණයකි.
(4) බැංකු ප්‍රකාශනයේ ඇති බැර ශේෂයයි.

(34) රු. 2 500 ක ගොඩනැගිලි කුලී චෙක්පතකින් ගෙවීමට අදාළ ද්විත්ව සටහන වනුයේ,
(1) මුදල් පොත හර 2 500
ගොඩනැගිලි කුලී බැර 2 500

(2) ගොඩනැගිලි කුලී හර 2 500
මුදල් පොත බැර 2 500

(3) ගොඩනැගිලි කුලී හර 2 500
බැංකු ගිණුම බැර 2 500

(4) බැංකු ගිණුම හර 2 500
ගොඩනැගිලි කුලී බැර 2 500

NWPEXAM

(35) බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කිරීම සඳහා උපයෝගී කරගනු ලබන මූලාශ්‍රයක් වනුයේ

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (2) බැංකු ගිණුම

(3) ශේෂ පිරික්සුම (4) බැංකු ප්‍රකාශය

(36) රු. 40 000 ක ණයට ගැනුම්, ගැනුම් ගිණුම හර කොට මුදල් පොතෙහි බැර පැත්තේ සටහන් කිරීම නිසා,

(1) ශේෂ පිරික්සුම 40 000 ක වෙනසක් ඇති වේ.

(2) ශේෂ පිරික්සුමේ හර තීරුව බැර තීරුවට වඩා 40 000 කින් වැඩි වේ.

(3) ශේෂ පිරික්සුමේ බැර තීරුව හර තීරුවට වඩා රු. 40 000 කින් වැඩි වේ.

(4) ඉහත කිසිවක් නොවේ.

(37) අමල්ට විකුණන ලද රු. 4 000 ක වටිනාකමක් සහිත භාණ්ඩ කමල්ගේ ගිණුමේ සටහන් වීම නිසා,

(1) ශේෂ පිරික්සුමෙහි සමානතාවයට බලපෑමක් ඇති නොවේ.

(2) හර තීරුව රු. 4 000 කින් වැඩි වේ.

(3) බැර තීරුව රු. 8 000 ක් අඩු වේ.

(4) හර හා බැර තීරු එකිනෙකට සමාන නොවේ.

(38) රු. 3 000 සේවක වැටුප් ගෙවීම සේවක වැටුප් ගිණුමේ සටහන් නොවීමේ වරද නිවැරැදි කරනු ලබන සටහන වනුයේ,

(1) වැටුප් ගිණුම හර 3 000<br>මුදල් ගිණුම බැර 3 000

(2) වැටුප් ගිණුම හර 3 000<br>අවිනිශ්චිත ගිණුම බැර 3 000

(3) වැටුප් ගිණුම හර 3 000<br>අවිනිශ්චිත ගිණුම බැර 3 000

(4) වැටුප් ගිණුම හර 6 000<br>අවිනිශ්චිත ගිණුම බැර 6 000

(39) ගැනුම් ගිණුම හර 1 000<br>අවිනිශ්චිත ගිණුම බැර 1 000<br>ලෙස නිවැරැදි කිරීමේ ද්විත්ව සටහන තබා ඇත්තේ කවර වරදක් සිදු වී ඇති විටක දී ද?

(1) ගැනුම් ගිණුමේ රු. 1 000 ක් වැඩියෙන් එකතු කොට තිබීම.

(2) අත්පිට ගැනුම් රු. 1 000 ක් මුදල් පොතේ සටහන් නොවීම.

(3) ගැනුම් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට පිටපත් වී නැත.

(4) රු. 1 000 ක ගැනුම්, ගැනුම් ගිණුමේ සටහන් වී නොතිබීම.

(40) ශේෂ පිරික්සුමෙහි වෙනසක් ඇති වූ විට එම වෙනස තාවකාලිකව ඇතුළත් කරනුයේ,

(1) ප්‍රාග්ධන ගිණුමේ ය. (2) අවිනිශ්චිත ගිණුමේ ය.

(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ය. (4) මුදල් පොතේ ය.

NWP EXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 11 - 2020

නම : .......................................... ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II කාලය : පැය 02යි.

වැදගත් :
- පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

- **පහත සිද්ධිය ඇසුරින් අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 20% ක් වයස්ගත වෙමින් පවතී. (2018 මහ බැංකු වාර්තාව) ඉහත ප්‍රවනතාවය තම ප්‍රදේශයේ අධ්‍යයනය කිරීමෙන් අනතුරුව දේශීය, පෝෂ්‍යදායී සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය හා අලෙවි කිරීමේ අවන්හලක් සුමාලි පෙරේරා සහ මිනෝලි තිසේරා "සුමිහිරි හෙළ බොජුන්" නමින් ආරම්භ කරන ලදී. ඒ සඳහා ව්‍යවසායකත්ව පාඨමාලාවක් හදාරා ඇති සුමාලි සහ ආහාර තාක්ෂණය පිළිබඳ උපාධිධාරිනියක් වන මිනෝලිගේ ප්‍රාග්ධන දායකත්වය සපයන ලදී. ඒ සඳහා සුමාලි රු. 500 000 ක් සහ මිනෝලි රු. 500 000 වටිනා ගොඩනැගිල්ල 2020/01/01 දින යොදවන ලදී. එදිනම රු. 300 000 බැංකු ණයක් ලබා ගන්නා ලදී. අවන්හලේ නිෂ්පාදන කටයුතු මිනෝලිත් අලෙවි කටයුතු සුමාලිත් අතර බෙදා ගන්නා ලදී. අංශ දෙකේ කටයුතුවල සහාය සඳහා නුපුහුණු සේවකයෙක් වන තමාලි බඳවා ගන්නා ලදී. සුමිහරි නිෂ්පාදනය වැඩිහිටියන් හා නිරෝගිකම රැක ගැනීමට කැමති සියළු දෙනා අතර ජනප්‍රිය විය.

2020 ජනවාරි මාසයේ සිදුවූ ගණුදෙනු මෙසේ ය.

| | | |
|---|---|---|
| 2020/01/03 | ආහාර සැකසුම් ද්‍රව්‍ය ගැණුම් | 100 000 |
| 2020/01/04 | ඇසුරුම් ද්‍රව්‍ය වියදම | 80 000 |
| 2020/01/05 | ආහාර සැකසුම් ද්‍රව්‍ය ණයට ගැණුම් | 15 000 |
| 2020/01/25 | ජල බිල් ගෙවීම | 3 000 |
| 2020/01/26 | බැංකු ණය වාරිකය ගෙවීම. (එහි ඇතුළත් පොලිය රු. 2 000) | 10 000 |
| 2020/01/27 | විදුලි බිල ගෙවීම | 4 000 |
| 2020/01/29 | සේවක වැටුප් ගෙවීම | 20 000 |
| 2020/01/28 | විකුණුම් ආදායම | 170 000 |

2020/01/29 දඹුලු ෆර්නිචර්ස් වෙතින් 50 000ක ලී බඩු ණයට ගන්නා ලදී.

2020/01/31 ව්‍යාපාරයට නව පළපුරුදු සේවකයෙක් බඳවා ගැනීමට තීරණය කළ අතර එය ව්‍යාපාරයට අයත් සමාජ ජාලා වෙබ් අඩවියේ දැන්වීම් පළ කරන ලදී. 2020/02/01 දින සිට ජංගම ගිණුමක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. (මිල දී ගත් ද්‍රව්‍ය කිසිවක් ඉතිරි වී නැත.)

(i) (අ) "සුමිහිරි හෙළ බොජුන්" අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ ඇති වාසියක් හ අවාසියක් ලියන්න.

(ii) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයක් හා බාහිර පරිසර සාධකයක් නම් කර, ඒවා සඳහා නිදසුන් සිද්ධියේ සඳහන් "සුමිහිරි හෙළ බොජුන් ව්‍යාපාරය" ඇසුරින් ලියන්න. (පිළිතුරු සැපයීමට පහත වගුව භාවිත කරන්න.)

| අභ්‍යන්තර පරිසර සාධකය | නිදසුන |
|---|---|
| 1. | |
| බාහිර පරිසර සාධකය | නිදසුන |
| 2. | |

NWP EXAM

(iii) (අ) බෙදාහැරීමේ ක්‍රියාවලියේ දී අතරමැදියෙකු වශයෙන් මෙම ව්‍යාපාරය කවර වෙළඳාමක නිරත වේ ද?
(ආ) මෙම ව්‍යාපාරයට ජංගම ගිණුමක් ආරම්භ කළ හැකි බැංකු වර්ගය නම් කරන්න.

(iv) (අ) මෙම සිද්ධියේ සඳහන් සන්නිවේදන මාධ්‍යයක් හා ඊට අදාළ සන්නිවේදන ක්‍රමය ලියන්න.
(ආ) මෙම සිද්ධියේ සඳහන් කළමනාකරණ ක්‍රියාවලියේ පහත සඳහන් කාර්යවලට නිදසුන් සපයන්න.
සැලසුම්කරණය
සංවිධානකරණය

(v) 2020/01/01 දිනට "සුමිහිරි හෙළ බොජුන්" ව්‍යාපාරයේ ගිණුම්කරණය සමීකරණය වටිනාකම් සහිතව ලියන්න.

(vi) (අ) සුමිහිරි හෙළ බොජුන් ව්‍යාපාරයේ විදුලි බිල් ගෙවීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.
(ආ) සුමිහිරි හෙළ බොජුන් ව්‍යාපාරයේ මුළු වගකීම්වල වටිනාකම 2020/01/31 දිනට දක්වන්න.

(vii) (අ) 2020/01/29 ලී බඩු මිලට ගැනීමට අදාළ ගනුදෙනුවේ මූලික පොත හා මූලාශ්‍ර ලේඛනය ලියා දක්වන්න.
(ආ) එම ගණුදෙනුව මූලික පොත තුළ සටහන් කර පෙන්වන්න.

(viii) 2020/01/31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) පහත සඳහන් ගිණුම් වර්ගවලට බලාපන සිද්ධියේ සඳහන් ගණුදෙනුව බැගින් ලියන්න.
(අ) වත්කම්
(ආ) වගකීම්
(ඇ) වියදම්
(ඉ) ආදායම්

(x) 2020 ජනවාරි 31 දිනට අයිතිකරුවන්ගේ හිමිකම ගණනය කරන්න. (පහත සමීකරණය ආධාර කරගන්න.)

| | | |
|---|---|---|
| 2020/01/01 ප්‍රාග්ධනය | | x x x |
| ( + ) ආදායම් | x | |
| ( + ) අතිරේක ප්‍රාග්ධනය | x | x x |
| | | x x x |
| ( - ) වියදම් | | ( x ) |
| 2020/01/31 දිනට හිමිකම | | ? |

(ලකුණු 2×10=20)

## I කොටස
## ව්‍යාපාර අධ්‍යයනය
**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)**

(02) (i) (අ) ව්‍යාපාරයක ප්‍රධාන අරමුණක් ලියන්න.
(ආ) එම අරමුණ කරා ළඟා වීම සඳහා ව්‍යාපාර විසින් සිදුකරනු ලබන ප්‍රධාන කාර්යය කුමක් ද?

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) පාරිභෝගිකයින් විවිධ වූ වුවමනා සපුරා ගැනීම තුළින් අවශ්‍යතා ඉටු වේ.
(ආ) නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් තිබීම තුළින් අයිතිකරුවන්ගේ අරමුණු ඉටු වේ.
(ඉ) භාණ්ඩ මත බදු පැනවීමෙන් ව්‍යාපාර වියදම් ඉහළ යා හැකි යි.
(ඊ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව හේතුවෙන් වර්තමානයේ ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත් ව ඇත.

(iii) සහල් නිෂ්පාදනය කර බෙදාහරින ව්‍යාපාරයක් තම අතිරික්ත නිෂ්පාදන යල් පැන ගිය පසු රසායනික ද්‍රව්‍ය යොදා වෙළෙඳපලට එවීම පිළිබඳ ප්‍රවෘත්තියක් වාර්තා විය.
(අ) මෙම ප්‍රවෘත්තිය බලපාන ඇල්මැති පාර්ශවයක් වන්නේ කවුරුන් ද?
(ආ) ඉහත සිද්ධිය වැනි අවස්ථාවන්හි දී පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතනය කුමක් ද?

(iv) සමන්තිකා මහත්මිය දෙසැම්බර් මස තායිලන්තයේ සංචාරයකට යාමට අදහස් කරන ලදී. ඇය ඒ සඳහා අමා පෙරේරා විසින් පවත්වාගෙන යනු ලබන "අමා සංචාරකයෝ" නියෝජිත ආයතනය හා සම්බන්ධ වන ලදී.
(අ) ඉහත සමන්තිකා මහත්මිය විසින් සපුරා ගැනීමට අපේක්ෂා කරනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(ආ) "අමා සංචාරකයෝ" ව්‍යාපාර ආයතනය ලියාපදිංචිය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 02ක් ලියන්න.



NWPEXAM

(03) (i) (අ) ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජනයක් ලියන්න.
(ආ) ව්‍යාපාර සංවිධානයක් හිමිකාරිත්වය මත ආකාර දෙකකට වර්ග කළ හැක. ඒවා නම් කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) සමූපකාර සමිති හිමිකාරත්වය අනුව රාජ්‍ය අංශයට අයත් වේ.
(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර සමඟ සැසඳීමේ දී නිර්ණායකයක් ලෙස ව්‍යාපාර කොටස ද සලකා බලනු ලබයි.
(ඉ) ලංකා ගමනාගමන මණ්ඩලයෙහි ලාභය රජය සතු වේ.
(ඊ) ඉතුරුම් තැන්පතුවක ඇති මුදල් ආපසු ලබාගැනීම සඳහා හරපත භාවිත කළ හැකි ය.

(iii) උපුල් ඖෂධ බෙදාහැරීමේ ව්‍යාපාරයක කළමනාකාරවරයකු ලෙස සේවයට බැඳෙන ලදී. උපුල් තම කටයුතු වඩාත් පහසු කර ගැනීම සඳහා බැංකු ගිණුමක් ඇරඹීමට අපේක්ෂා කරයි.
(අ) උපුල්ට ඇරඹීමට වඩාත් සුදුසු ගිණුම් වර්ගය කුමක් ද?
(ආ) ඖෂධ බෙදාහරීමේ ව්‍යාපාරයට වාණිජ බැංකුවකින් ලබාගත හැකි සේවා 02ක් ලියන්න.

(iv) සුමාලි භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා නිතරම තම ණයපත භාවිත කරයි. අන්තර්ජාල මිලදී ගැනීම් සඳහා ද ණයපත යොදා ගනී.
(අ) ණයපත භාවිත කිරීමෙන් සුමාලිට ඇති විය හැකි අවදානම් 02ක් දක්වන්න.
(ආ) ණයපත භාවිත කර විද්‍යුත් ජාල ඔස්සේ කළ හැකි ගණුදෙනු 02ක් නම් කරන්න.

(04) (i) (අ) රක්ෂණයේ සඳහන් වන "අවදානම් ඒකරාශී කිරීම" යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?
(ආ) විදේශ වෙළඳාමේ දී සහාය වන රක්ෂණ වර්ග 02ක් ලියන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) ආයතනයක් බාහිර සන්නිවේදනයේ දී විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය පමණක් භාවිත කරයි.
(ආ) සිදුවූ හානියට සරිලන වන්දියක් පමණක් ගෙවීම ජීවිත රක්ෂණයට අදාළ නොවේ.
(ඉ) චෙක්පත් පිටසන් කිරීම මගින් චෙක්පතට අමතර ආරක්ෂාවක් ලැබේ.
(ඊ) නියමිත කාලසටහනකට අනුව ධාවනය නොකිරීම දුම්රිය ප්‍රවාහනයේ දැකිය හැකි අවාසියකි.

(iii) හංසි සිල්වා විසින් බතික් සාරි නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර ගුණත්වයෙන් උසස් අනර්ඝ නිමාවෙන් යුත් සාරි වර්ග නගරයේ වෙළඳසැල් සඳහා බෙදා හරී.
(අ) බතික් සාරි නිෂ්පාදන ව්‍යාපාරය අයත්වන වෙළෙඳ ප්‍රභේදය නම් කරන්න.
(ආ) හංසිගේ ව්‍යාපාරයේ පාරිභෝගිකයින් වඩා හොඳින් තෘප්තිමත් කිරීම සඳහා භාවිත කරනු ලබන අලෙවිකරණ විචල්‍යය කුමක් ද?

(iv) සිසිල් බීම නිෂ්පාදනය කරනු ලබන ව්‍යාපාරික ආයතනයක් දෙසැම්බර් මස නිෂ්පාදනය අපේක්ෂිත පරිදි සිදු කළ ද අලෙවිය සාපේක්ෂව පහළ මට්ටමක පැවතිණි.
(අ) ඉහත සිද්ධියට අදාළව අලෙවිය පහළ යාමට බලපෑ හේතු සොයා බැලීම සඳහා කළමනාකරණ ක්‍රියාවලියේ කුමන පියවර අනුගමනය කළ යුතු ද?
(ආ) ඉතිරි වූ තොගය අලෙවිකිරීම සඳහා අලෙවි කළමනාකරුට ප්‍රවර්ධනයට භාවිත කළ හැකි ආකාරයක් යෝජනා කරන්න.

NWPEXAM

## II කොටස
## ගිණුම්කරණය
**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)**

(05) (i) (අ) ගිණුම්කරණයේ අරමුණ කුමක් ද?
(ආ) ව්‍යාපාරයක හිමිකම යනු කුමක් ද?

(ii) පහත දක්වා ඇත්තේ ගනුදෙනු දෙකකට අදාළ ද්විත්ව සටහන් දෙකකි. එම ගණුදෙනු මොනවා දැයි සඳහන් කරන්න.

(අ) ණයහිමි ගිණුම හර 12 000
බැංකු ගිණුම බැර 12 000

(ආ) ණයගැති ගිණුම හර 4 000
විකුණුම් ගිණුම බැර 4 000

(iii) චාමර පාසැල් උපකරණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2020/01/01 දින ආරම්භ කරන ලදී. පළමු සතියේ සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 100 000 ක් ප්‍රාග්ධනය ලෙස යෙදීම.
2. රු. 25 000 ක් ලී බඩු අත්පිට මිලට ගැනීම.
3. රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
4. රු. 30 000 ක පාසැල් උපකරණ ණයට ගැනීම.
5. රු. 5 000 සේවක වැටුප් ගෙවීම.

***අවශ්‍යවන්නේ,***

(අ) ඉහත එක් එක් ගණුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (පහත ආදර්ශ ආකෘතිය භාවිත කරන්න. පළමු ගණුදෙනුව එහි දක්වා ඇත.)

| ගණුදෙනුව | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| (1) | මුදල් + 100 000 = | | ප්‍රාග්ධනය + 100 000 |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |

(ආ) ඉහත ගණුදෙනුවලින් පසුව ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය වටිනාකම සහිතව දක්වන්න.
(ලකුණු 04)

(iv) කමල්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ සුළු මුදල් ගණුදෙනු පහත දැක්වේ. ජනවාරි 01 දිනට සුළු මුදල් ශේෂය රු. 400 කි. අග්‍රිමයේ වටිනාකම රු. 1,500කි.

1. 2020/01/01 අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම.
2. 2020/01/02 තැපැල් ගාස්තුව රු. 150 ක් ගෙවීම.
3. 2020/01/05 ගමන් ගාස්තුව රු. 200 ක් ගෙවීම.
4. 2020/01/15 සංග්‍රහ වියදම් රු. 180 ක් ගෙවීම.
5. 2020/01/28 තැපැල් ගාස්තුව රු. 100 ක් ගෙවීම.

***අවශ්‍යවන්නේ,***

ඉහත ගණුදෙනු සුළු මුදල් පොතක සටහන් කර 2020/01/31 දිනට සුළු මුදල් පොත තුලනය කර දැක්වීම.
(ලකුණු 04)

NWP EXAM

(06) (i) (අ) ආදායම් ගිණුම් ගත කිරීමේ දී අදාළ වන ද්විත්ව සටහන් මූලධර්මය සඳහන් කරන්න.
(ආ) වත්කමක ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) නිමි ඇඳුම අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සාරංගගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ සිදු වූ ගණුදෙනු කීපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 01/05 | රු. 300 බැගින් ළමා ඇඳුම් 20ක් අමල්ගෙන් ණයට ගැනීම (වෙළෙඳ වට්ටම 10%) |
| 01/10 | එකක් රු. 500 බැගින් සාරි 50ක් කුමාරගෙන් අත්පිට මිලදී ගැනීම. (වෙළෙඳ වට්ටම 5%) |
| 01/12 | එකක් රු. 1 000 බැගින් කමිස 8ක් නුවන්ගෙන් ණයට ගැනීම. |
| 01/15 | එකක් රු. 250 බැගින් කලිසම් 20ක් රංගගෙන් ණයට ගැනීම. (වෙළෙඳ වට්ටම 10%) |
| 01/20 | එකක් රු. 2 000 බැගින් ඇඳුම් රාක්ක 2ක් නාමල්ගෙන් ණයට ගැනීම. |

***අවශ්‍යවන්නේ,***
(අ) ගැනුම් ජ'නලය පිළියෙළ කරන්න.
(ආ) ලෙජර් ගිණුම් පිළියෙළ කරන්න. (ලකුණු 04)

(iii) වෙළෙඳ ව්‍යාපාරයක නිරත වන නාරදගේ ව්‍යාපාරයේ පහත වගුව නිවැරදිව සම්පූර්ණ කරන්න.

| ගණුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | මූලික සටහන් පොත |
|---|---|---|
| 1. රු. 500 000 ක මෝටර් රථයක් ණයට ගැනීම. | .................................... | .................................... |
| 2. ...................................................................................... | ගෙවීම් වවුචරය | .................................... |
| 3. ...................................................................................... | .................................... | විකුණුම් ජ'නලය |
| 4. රු. 5 000 ක කොමිස් ආදායමක් ලැබීම. | .................................... | .................................... |

(ලකුණු 02)

(iv) අමිලගේ ව්‍යාපාරය 2019 වර්ෂය අවසානයේ පහත ගිණුම් ශේෂයන් දක්නට ලැබුණි.

| | |
|---|---|
| විකුණුම් | 60 000 |
| ගැණුම් | 35 000 |
| වැටුප් | 20 000 |
| රක්ෂණ | 4 000 |
| ප්‍රාග්ධනය | ? |
| ඉඩම් | 80 000 |
| ගොඩනැගිලි | 30 000 |
| ණයගැතියෝ | 25 000 |
| ණයහිමියෝ | 15 000 |

***අවශ්‍යවන්නේ,***
(අ) අමිලගේ ව්‍යාපාරයේ ප්‍රාග්ධනය ගණනය කරන්න.
(ආ) 2019/12/31 දිනට අමිලගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න. (ලකුණු 04)

(07) (i) (අ) චෙක්පතක් ණයහිමියෙකුට නිකුත් කිරීමේ දී ඒ පිළිබඳ ව සනාථ කළ හැකි මූලාශ්‍රයක් නම් කරන්න.
(ආ) ණයගැතියෙකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ චෙක්පතක් අගරු වීම සටහන් කිරීමට අදාළ ජ'නල් සටහන ලියන්න.

(ii) රංජන්ගේ ව්‍යාපාරයේ 2019 ජනවාරි මස පිළියෙළ කළ බැංකු ගිණුමේ ශේෂය රු. 21 000 ක් වූ අතර එදිනට බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් අගයක් ගන්නා ලදී. පසුව පහත කරුණු අනාවරණය විය.
- බැංකුව අයකළ ගාස්තු රු. 2 000 ක් බැංකු ගිණුමේ සටහන්ව නැත.
- ණයහිමියන්ට නිකුත් කළ චෙක්පත් වටිනාකම රු. 45 000 ක් වූ අතර ඉන් බැංකුවට ඉදිරිපත් වී ඇත්තේ රු. 38 000 ක් පමණි.


NWP EXAM

- ණයගැති ප්‍රේෂණ වට්ටිනාකම රු. 4 000 කි.
- තැන්පත් කළ රු. 12 000 ක චෙක්පතක් උපලබ්ධි වී නොමැත.
- ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරිකය රු. 3 000 කි.

***අවශ්‍යවන්නේ,***

(අ) ජනවාරි මාසය සඳහා සංශෝධිත බැංකු ගිණුම

(ආ)බැංකු සැසඳුම් ප්‍රකාශනය

(iii) (අ) ගිණුම්කරණයේ දී සිදුවන වැරැදි නිවැරැදි කිරීමේ දී ඒ පිළිබඳව සටහන් තබා ගන්නා මූලික පොත හා මූලාශ්‍ර ලේඛනය නම් කරන්න. (ලකුණු 01)

(ආ) ශේෂ පිරික්සුම සමාන වුව ද ගිණුම්කරණයේ දී සිදුවිය හැකි වැරැදි දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(iv) රාමාගේ ව්‍යාපාරයේ 2019 වර්ෂය අවසානයේ පිළියෙළ කළ ශේෂ පිරික්සුම සමාන නොවූ අතර එහි වෙනස වූ රු. 4 000 අවිනිශ්චිත ගිණුමේ හරට සටහන් කරන ලදී. පසුව පහත වැරැදි හඳුනාගන්නා ලදී.

- රු. 5 000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් ම පොත්වලින් මඟ හැරී තිබීම.
- විදුලි වියදම ලෙස ගෙවූ රු. 4 000 විදුලි වියදම් ගිණුමේ සටහන් ව නැත.
- රු. 8 000 මෝටර් රථ අළුත් වැඩියා වියදම් මෝටර් රථ ගිණුමේ සටහන්ව ඇත.

***අවශ්‍යවන්නේ,***

(අ) අවිනිශ්චිත ගිණුම

(ආ) වැරැදි නිවැරැදි කිරීමට අදාළ ජ'නල් සටහන් (ලකුණු 04)

NWP EXAM